නීති හා විමර්ශන අංශය
මැතිවරණ කොමිෂන් සභාව
16 MAR 2021

# පක්ෂ ව්‍යවස්ථාව

## 1. පක්ෂය

### I. නාමය

ප්‍රජාතන්ත්‍රවාදය, ධරණීය, සංවර්ධනය, වංචාවෙන් දූෂණයෙන් තොර යහපාලනය, ගුණාත්මක දේශපාලනය, එක්සත්බව, සංහිඳියාව, තහවුරු කිරීමට ඇප කැපවන පක්ෂය

අ. එක්සත් ජාතික නිදහස් පෙරමුණ

ආ. ஐக்கிய தேசிய சுதந்திர முன்னணி

ඇ. ද යුනයිටඩ් නැෂනල් ෆ්‍රීඩම් ෆ්‍රන්ට්

United National Freedom Front

### II. වර්ණය

කොළ, කහ, නිල්, රතු යන සිව් වර්ණය

### III. ලාංඡනය

කෙසෙල් ඇවරිය

## 2. ලිපිනය

118, බාන්ස් පෙදෙස, කොළඹ 07.

## 3. අරමුණු

අ. ශ්‍රී ලංකාව තුල ප්‍රජාතන්ත්‍රවාදය සහතික කිරීම හා රටට ගැලපෙන පාලන තන්ත්‍රයක් බිහිකිරීමෙලා පෙනී සිටීම.

ආ. ශ්‍රී ලංකාවට ගැලපෙන්නා වූ ධරණීය සංවර්ධනයක් වෙනුවෙන් ඇපකැපවීම හා දූෂණය, වංචාව තුරන් කිරීමට ඇපකැපවීම.

ඇ. දේශපාලන දැනුමින් හා වෘත්තීමය භාවයෙන් යුත් ගුණාත්මක දේශපාලඥයන් බිහිකිරීම හා සාමාන්‍ය ජනතාවගේ දේශපාලන දැනුම වර්ධනය කිරීමට ඇපකැපවීම.

ඈ. ශ්‍රී ලාංකික ජාතියක් සඳහා ජාතික ආගමික සංහිඳියාව ගොඩනැගීමට ඇප කැපවීම.

ඉ. දේශපාලනය තුල උගත්, වෘත්තීමය තරුණ හා කාන්තා නියෝජනය ඉහල නැංවීම සඳහා ඇපකපවීම.

ඊ. අපගේ දේශපාලන මතය ප්‍රචාරය කිරීම, ඒ මතය හා සමාන මත දරන හෝ අපගේ මතය පිළිගන්නා සංවිධාන, පුද්ගලයින්, කණ්ඩායම් හා පක්ෂ සමග එකාබද්ධව කටයුතු කිරීම.

උ. අ සිට ඊ දක්වා අරමුණු සමාජ ගත කිරීම.

## 4. සාමාජිකත්වය

I. පක්ෂයේ ප්‍රතිපත්ති හා ව්‍යවස්ථාව පිළිගන්නා වයස අවුරුදු දාසයෙන් ඉක්ම වූ ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා සාමාජිකත්වය ලබාගත ගත හැකිය.

II. වාර්ෂිකව සාමාජික ගාස්තුව රු රුපියල් 100/කි. එම මුදල ගෙවා ලබාගන්නා සාමාජිකත්වය වසරකට පමණක් වලංගු වෙයි.

III. අ. මහා සභාවේ ඡන්දය විමසන අවස්ථාවේදී සිය අභිමතය පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය එහි සාමාජිකයන්ට ඇත.

ආ. සාමාජිකයින් පක්ෂයේ විනයට අනුකූල වියයුතු අතර විනය බලය එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විධායක සභාව පත් කරනු ලබන විනය කමිටුව සතු අතර එකී විනය කමිටුවක් විසින් ගනු ලබන තීරණ වලට අනුකූලව කටයුතු කිරීමට සාමාජිකයින් බැඳී සිටියි.

ඇ. එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විනය කමිටු සාමාජිකයින් 3 දෙනෙකුගෙන් සමන්විත වන අතර විධායක සභාව විසින් යෝජනා කරනු ලබන 3 දෙනෙකු විධායක කමිටුවේ බහුතර කැමැත්තෙන් එහි එහි සාමාජිකයින් ලෙස පත්කරනු ලබයි.

ඈ. එක්සත් ජාතික නිදහස් පෙරමුණේ සාමාජිකයින්ගේ විනය සම්බන්දව සහ විනය කමිටුව පත් කිරීම සහ එම කමිටුවට අදාළ බලතල සම්බන්දව සියලුම කාරනා ඇතුලත් යෝජනා සම්මතයක් විධායක සභාව සභාව විසින් සම්මත කරගනු ලැබියයුතු අතර එතැන් පටන් එකී යෝජනා සම්මතය එක්සත් ජාතික නිදහස් පෙරමුණේ විනය නීති සංග්‍රහය වන්නේය.

ඉ. මහා සභාවේ ඡන්දය විමසන අවස්ථාවේදී සිය අභිමතය පරිදි ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය එහි සාමාජිකයින්ට ඇත.

ඊ. පක්ෂයේ සාමාජිකයෙකු හෝ පක්ෂයේ කිසියම් වගකීම් සහගත තනතුරක් දරන පුද්ගලයෙකු විසින් වෙනත් දේශපාලන සංවිධානයක හෝ දේශපාලන මුහුණුවරක් සහිත සංවිධානයක සාමාජිකත්වය හෝ කිසියම් තනතුරක් ලබා ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා එක්සත් ජාතික නිදහස් පෙරමුණෙහි විධායක සභාවේ පූර්ව අනුමැතිය ලබාගත යුත්තේය. එසේ නොවන්නේ නම් කිසියම් පුද්ගලයෙකු යම් තනතුරක් හෝ සාමාජිකත්වයක් හෝ පෙර සඳහන් සංවිධානවල ඇත්තේනම් පක්ෂයෙහි ඔහු දරන සියලු වගකීම් හෝ තනතුරු අත්හිටුවීමේ පූර්ණ බලය පක්ෂයේ විධායක සභාව සතු වන්නේය.

IV. කිසිදු සාමාජිකයකු තවත් සාමාජිකයකු ප්‍රසිද්ධියේ විවේචනය නොකළයුතු අතර කිසියම් චෝදනාවක් වේනම් පළමුව ඔහු/ඇය සමග සාකච්ඡා කිරීමත් එමගින්ද විසඳුමක් නොලබෙන්නේනම් විනය කමිටුව වෙත දැනුම්දීමක් කල යුතුය. එහිදී විනය කමිටුව විසින් ඒ සම්බන්ධව දෙසතියක් තුල සුදුසු පරිදි කටයුතු කරන අතර එහි තීරණය සියලු පාර්ශවයන් පිළිගැනීමට බැඳීසිටියි.

V. පක්ෂයේ ප්‍රතිපත්ති කඩකරමින් සංවිධානයට බරපතල අගතියක් සිදුකරන බැවින් කිසියම් සාමාජිකයකුගේ සාමාජිකත්වය අත්හිටුවිය යුතු බවට සාමාජිකයකුගෙන්ම ලැබෙන්නා වූ පැමිණිල්ලක් මත විනය කමිටුව විසින් කරනු ලබන අපක්ෂපාතී පරීක්ෂණයකින් වැරදි කරුවකු වුවහොත් මිසක හෝ ඉල්ලා අස්වීමේ ලිපියක් ලබාදුනහොත් හෝ වාර්ෂිකව සාමාජිකත්වය අලුත්කර නොගතහොත් පමණක් සාමාජිකත්වය අහෝසිවන්නේය.

VI. විනය කමිටුව ගන්නා තීරණ විධායක සභාවට දැනුම් දියයුතු අතර විධායක සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම කල යුතුය

## 5. පක්ෂයේ ව්‍යුහය

### I. මධ්‍යම කාරක සභාව මහා සභාව වන්නේ ය.

අ. මහා සභාවක් ඇත. එහි 15 කට නොඅඩු 60 කට නොවැඩි සාමාජිකයින් ප්‍රමාණයක් සිටිය හැකිය.

ආ. මහා සභාවේ සනපූර්ණය 15ක් විය යුතු අතර සනපූර්ණය නොමැතිව මහා සභාව පවත්වාගෙන යා නොහැකිය.

ඇ. මහා සභාවේ ප්‍රධානියා සභාපතිවරයාය. සභාපතිවරයා නොමැති අවස්ථාවල උප සභාපතිවරයා මහා සභාවේ ප්‍රධානියා වන්නේය.

ඇ. මහා සභාවට සාමාජිකයින් පත් කිරීම විධායක සභාව විසින් ප්‍රධාන ලේකම් වරයාගේ අත්සනින් යුතුව සිදු කරනු ලබන්නේ ය.

ඇ(1). පක්ෂයේ සාමාජිකයෙකු මහා සභාව නියෝජනය නොකළ යුතු යැයි විධායක සභාව විසින් විශ්වාස කරන්නේ නම් ගරු සභාපතිවරයා විමසීමෙන් අනතුරුව එම අයගේ මහා සභාවේ නියෝජනය යම් කිසි කාලයකට හෝ සම්පූර්ණයෙන් අහිමි කිරීමට හැකි වන්නේ ය. නමුත් මෙමගින් එම පක්ෂ සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අහිමි වීමක් සිදු නොවේ.

ඉ. මහා සභාව සෑම මාස 3කට වරක්ම අවම වශයෙන් රැස්විය යුතුය.

ඊ. මහා සභාවේ සනපූර්ණ නොමැති අවස්තාවක හදිසි කාරනාවක් නොමැතිනම් පමණක් මීළඟ මහා සභා දිනය තෙක් කල්දැමිය හැකිය.

උ. මහා සභාවේ සාමාජිකයකු ඉවත්කළ හැක්කේ අකාර්යක්ෂමතාවය, විනය විරෝධී කටයුතු කිරීම හෝ ඉල්ලා අස්වීමකදී ය.

ඌ. මහා සභාව කැඳවීම, මහා සභාවට සහභාගීවන්නන් තීරණය කිරීම, මහා සභාවේ කටයුතු තීරණය කිරීමට විධායක සභාවට බලය ඇත.

## II. නිලධාරී මණ්ඩලය

අ. සභාපති වරයෙක් වන්නේය. මහා සභාවේ සහ විධායක සභාවේ සභාපතිවරයා වන්නේය. මහා සභාවේ බහුතරයේ විශ්වාසය ඇතිතාක් දුරට සභාපතිවරයාට එම තනතුරේ කටයුතු කල හැකිය. මහා සභාව සහ විධායක සභාව විටින් විට පවරනු ලබන බලතල සභාපති විසින් ක්‍රියාත්මක කල යුතුය.

ආ. ප්‍රධාන ලේකම් වරයෙක් වන්නේය. විධායක සභාවේ බහුතර ඡන්දයෙන් ඔහු පත්කර ගනී. පළමු ප්‍රධාන ලේකම්වරයා පක්ෂය පිහිටුවීමෙන් පසු අවුරුදු 12ක් සඳහා නිල බලයෙන් තම ධුරය උසුලනු ලබන්නේය සභාපති විමසා නිලධාරී මණ්ඩලයට නව තනතුරු හා විධායක කාරක සභාවට සාමාජිකයින් පත්කර ගැනීම, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සංවිධායකවරුන් පත් කිරීම, පක්ෂයේ ලිපි ලේඛන භාරව කටයුතු කිරීම, පක්ෂයේ සියලු ලිපි ලේඛන සඳහා පක්ෂය නියෝජනය කරමින් අත්සන් තැබීමේ බලය ඇති නිලධාරියා ලෙස කටයුතු කිරීම, පක්ෂයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අළුතින් තනතුරු ඇතිකර ගත යුතු නම් විධායක සභාව විමසා එහි අනුමැතිය මත තනතුරු ඇති කිරීම සහ සුදුසු අය පත් කිරීම, තවද මහා සභාව විසින් විටින් විට පවරන බලතල ලේකම්වරයා විසින් ක්‍රියාත්මක කල යුතුය.

ඇ. පක්ෂයට න්‍යායාචාර්යවරයකු වන්නේය. පක්ෂයේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදීත්, පක්ෂයේ දේශපාලන උපායමාර්ග සකස් කිරීමේදීත් අවශ්‍ය මගපෙන්වීම සිදුකිරීම ඔහුගේ කාර්යභාරය වන්නේය. මහා සභාවේ වාර්ෂික නිලවරණයෙන් තේරීපත්වන අතර මහා සභාවේ විශ්වාසය අතිතාක් කල් තනතුරු දැරිය හැකිය. මහා සභාව විසින් විටින් විට පවරනු ලබන කාර්යයන්ද ඉටුකිරීමට නයාචාර්යවරයා කටයුතු කල යුත්තේය.

ඈ. ජාතික සංවිධායකවරුන් තිදෙනෙක් වන්නේය. ඔවුන් තිදෙනා වෙත විධායක සභාව විසින් කාලීන අවශ්‍යතාවය මත විටින් විට පවරන්නා වූ වගකීම් ඉටු කිරීමට බැඳී සිටින්නේය. විධායක සභාවේ බහුතර අනුමැතිය මත පක්ෂයේ මහ ලේකම්වරයා විසින් නිකුත් කරනු ලබන ලිපියක් මගින් ජාතික සංවිධායක වරුන් පත්කරනු ලබන්නේය. එසේ නොවන අවස්ථාවන් වලදී විධායක සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පක්ෂයේ සභාපතිවරයා විමසා බලා මහ ලේකම්වරයා හට උක්ත පත්කිරීම් සිදු කිරීමට බලය පැවරෙන්නේය.

ඉ. භාණ්ඩාගාරිකවරයෙක් වන්නේය. සංවිධානයේ අරමුදල් භාරව කටයුතු කිරීම, අරමුදල් තරකිරීම භාණ්ඩාගාරිකට පැවරෙන්නේය. මහා සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර මහා සභාවේ බහුතරයේ කැමැත්ත ඇතිතාක් එම තනතුරේ කටයුතු කල හැකිය.

ඊ. ප්‍රචාරක ලේකම්වරයෙක් වන්නේය. පක්ෂයේ ප්‍රතිපත්ති, පක්ෂයේ පණිවිඩ ග්‍රාමීය මට්ටම දක්වා ප්‍රචාරය කිරීම, ඒ සඳහා අවශ්‍ය සංවිධාන කමිටු ගොඩනැගීම සඳහා විධායක සභාවේ පූර්ව අනුමැතිය ලබාගත යුත්තේය.

උ. උප සභාපතිවරු 5 දෙනෙක් වන්නේය. සභාපතිවරයාගේ කටයුතු වලට සහය වීමට කාන්තා නියෝජනය ඇතුළු 05 දෙනෙකු විධායක සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිතාක් එම තනතුරේ කටයුතු කල හැකිය. සභාපතිවරයා නොමැති අවස්ථාවල සභාපතිධුරයේ වැඩ ආවරණය කරනු ලැබිය යුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටුකළ යුතුය.

ඌ. උප ලේකම්වරු 05 දෙනෙකු වන්නේය. ලේකම්වරයාගේ කටයුතු වලට සහය වීමට මහා සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිතාක් එම තනතුරේ කටයුතු කල හැකිය. ලේකම්වරයා නොමැති අවස්ථාවල ලේකම්ධුරයේ වැඩ ආවරණය කරනු ලැබියයුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටුකළ යුතුය.

එ. උප භාණ්ඩාගාරිකවරයෙක් වන්නේය. භාණ්ඩාගාරිකවරයාගේ කටයුතු වලට සහය වීමට මධ්‍යම කාරක සභාවේ බහුතර ඡන්දයෙන් වාර්ෂිකව පත්වන අතර විධායක සභාවේ බහුතර කැමැත්ත ඇතිතාක් එම තනතුරේ කටයුතු කල හැකිය. භාණ්ඩාගාරිකවරයා නොමැති අවස්ථාවල ප්‍රධාන භාණ්ඩාගාරික ධූරයේ වැඩ ආවරණය කරනු ලැබියයුතු අතර වරින්වර විධායක සභාව විසින් පවරන වගකීම් ඉටුකළ යුතුය.

ඒ. 5. I. අ. ට යටත්ව 5. II. ආ. පරිදි 5. II. ඕ. සඳහා පත්කරන සාමාජිකයින් අතරින් පක්ෂයේ ප්‍රධාන ලේකම්ගේ කටයුතු පහසු කර ගැනීම සඳහා අංශ භාර ලේකම්වරුන් ප්‍රධාන ලේකම් විසින් අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර වෙනුවෙන් වාර්ෂිකව පත්කරගන්නේය. එම ලේකම්වරුන් විසින් අදාළ ක්ෂේත්‍රය සම්බන්ධ වගකීම් ඉටුකළ යුත්තේය.

ඔ. කාරක සභිකයන් වන්නේය. පක්ෂයේ කටයුතු සඳහා සහාය වීමට විවිධ ක්ෂේත්‍රයන් වෙනුවෙන් 5. I. අ. ට යටත්ව 5. II. ආ. පරිදි කාරක සභිකයින් වාර්ෂිකව පත් කිරීමට ලේකම්වරයාට හැකිය. විධායක සභාවේ බහුතරයේ කැමැත්ත ඇතිනාක් එම තනතුරේ කටයුතු කල හැකිය. විධායක සභාව විසින් වරින් වර පවරන වගකීම් ඉටුකළ යුතුය.

ඕ. පක්ෂයට විගනකවරයෙක් වන්නේය. විධායක සභාවේ අනුමැතිය මත පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් වරලත් ගණකාධිකාරීවරයා පත්කරනු ලබන අතර එම තනතුර වසර දෙකකට වලංගු වන්නේය. පක්ෂයේ මූල්‍ය කටයුතු විනිවිදභාවයකින් පවත්වාගෙනයාමට අවශ්‍ය නිර්දේශ මගපෙන්වීම මහා සභාවට ඉදිරිපත් කිරීම, වාර්ෂිකව ගිණුම් විගණනය කිරීම ඔහු සතු කාර්ය වන්නේය.

## III. අනෙකුත් සංවිධාන

අ. කාන්තා බල මණ්ඩලයක් ඇත්තේය.

ආ. තරුණ බල මණ්ඩලයක් ඇත්තේය.

ඇ. වෘත්තීය සමිති අංශයක් ඇත්තේය.

ඈ. දේශපාලන අධ්‍යාපන අංශයක් ඇත්තේය.

ඉ. ප්‍රතිපත්ති හා ව්‍යවස්ථා අංශයක් ඇත්තේය.

ඊ. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ඇත්තේය.

උ. විදේශ/සම්බන්ධතා අංශයක් ඇත්තේය.

## IV. දිස්ත්‍රික් සංවිධාන

අ. පක්ෂය තුල දිස්ත්‍රික් සංවිධාන තිබිය යුත්තේය.

ආ. දිස්ත්‍රික් සංවිධානයේ ප්‍රධානියා දිස්ත්‍රික් සංවිධායක වන අතර විධායක සභාව විසින් එම පත් කිරීම හා ඉවත් කිරීම සිදුකරනු ලබන්නේය.

ඇ. ජාතික සංවිධායක විසින් එක් එක් ප්‍රාදේශීය බල ප්‍රදේශ සඳහා සංවිධායකයින් පත් කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලබන්නේය.

ඈ. විධායක සභාව විසින් ගනු ලබන තීරණ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කිරීම මෙහි කාර්ය භාර්ය වන්නේය.

## V. ප්‍රාදේශීය සංවිධාන

අ. පක්ෂය තුල ප්‍රාදේශීය සංවිධාන තිබිය යුත්තේ අවම වශයෙන් මැතිවරණ දිස්ත්‍රික්ක ඡන්ද කොට්ටාශ දෙකක් සඳහාවත් ප්‍රාදේශීය සංවිධාන බිහිකළ යුත්තේය.

ආ. ප්‍රාදේශීය සංවිධානයේ ප්‍රධානියා කොට්ටාශ සංවිධායක වන අතර විධායක සභාව විසින් එම පත් කිරීම හා ඉවත් කිරීම සිදුකරනු ලබන්නේය.

ඇ. කොට්ටාශ සංවිධායක විසින් එක් එක් ඡන්ද පොල බලප්‍රදේශ සඳහා සංවිධායකයින් පත් කිරීමට ප්‍රධාන ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලබන්නේය.

ඈ. විධායක සභාව හෝ ජාතික සංවිධායක වරයා විසින් ගනු ලබන තීරණ ගම් නගර මට්ටම තුල ක්‍රියාත්මක කිරීම මෙහි කාර්යභාරය වන්නේය.

## VI. විධායක සභාව

අ. විධායක සභාවක් වන්නේ ය. එහි සාමාජිකයින් ගණන 13 කි. විධායක සභාවේ නිල බලයෙන් සාමාජිකත්වය හිමි වන්නේ පක්ෂ සභාපති, පක්ෂ ලේකම්, පක්ෂ උප සභාපති, පක්ෂ උප ලේකම්, පක්ෂ භාණ්ඩාගාරික, පක්ෂ ජාතික සංවිධායක, පක්ෂ ප්‍රචාරක ලේකම්, විනය කමිටු සභාපති, ප්‍රධාන ලේකම්වරයා විසින් සභාපතිවරයා විමසා පත්කරගනු ලබන ඉහත නිලතල නොදරන තවත් සාමාජිකයින් 5 දෙනෙක්. ඔවුන්ගේ ධූර කාලය වර්ෂයක් වන අතර ඔවුන් නැවත පත් කිරීමට සුදුසුකම් ලබන්නේය.

ආ. විධායක සභාව පක්ෂයේ උත්තරීතර බල මණ්ඩලය වන්නේ ය.

ඇ. විධායක සභාව වගකියනු ලබන්නේ පක්ෂයේ සභාපතිවරයාට සහ ලේකම්වරයාට පමණක් වන්නේ ය.

ඇ. පක්ෂ ලේකම්වරයා විසින් යම් අයෙකු අමතා ලිඛිතව යවනු ලබන ඉවත් කිරීමේ ලිපියක් මගින් විධායක සභාවේ සාමාජිකත්වය ඉවත් කරනු ලැබිය හැකි වන්නේය. (සභාපතිවරයා හැර)

ඉ. පක්ෂ සමාජිකයන්ගේ විනය සම්බන්ධ තීරණ හැර පක්ෂයේ සියලුම දේශපාලනික තීරණ ගැනීමේ තනි අයිතිය විධායක සභාවට හිමි වන්නේය. මහසභාවේ යෝජනා විධායක සභාව විසින් තම තීරණ ගැනීමේදී සලකා බැලිය හැකි වුවත් විධායක සභාව ඒවායින් බැඳී නොසිටී.

ඊ. විධායක සභාවේ සණපූරණය 5ක් විය යුතු අතර සණපූරණය නොමැතිව විධායක සභාව පවත්වාගෙන යා නොහැකිය.

## 6. අරමුදල්

අ. පක්ෂයේ අරමුදල් විධායක සභාව භාරයේ පවතී. විධායක සභාව එහි භාරකාරත්වය තීරණය කරනු ඇති අතර එය භාණ්ඩාගාරික වෙත පැවරේ.

ආ. පක්ෂයේ අරමුදල් සාමාජික ගාස්තු පරිත්‍යාගයන් හා ආධාර හා විවිධ වැඩසටහන් මගින් උපයාගන්නා අරමුදල් මත රඳා පවතී.

ඇ. පක්ෂයේ අරමුදල් තරකරගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විධායක සභාවට හැකිය. බැංකු ගිණුම් ආරම්භ කිරීමේ හා ආයෝජනය කිරීමේ අභිමතය ද විධායක සභාවට ඇත.

ඈ. පක්ෂයේ අරමුදල් තත්වය පිලිබඳ එක් එක් මහා සභා රැස්වීම් වලදී මහා සභාව දැනුවත් කිරීම භාණ්ඩාගාරිකගේ යුතුකමකි.

ඉ. වාර්ෂිකව පැවැත්වෙන මහා සභා රැස්වීමට භාණ්ඩාගාරික විසින් වාර්ෂික ගිණුම් වාර්තාව ඉදිරිපත් කල යුතුය.

ඊ. තවද පක්ෂයට නිශ්චල හා චංචල දේපල අත්පත් කර ගැනීමට මහා සභාවට අවසර ඇති අතර එය පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාගේ භාරයේ පවතින්නේය.

උ. පක්ෂයේ ගිණුම් වාර්ෂිකව විගණනයකට යටත්වන අතර විගණක වරයා පත්කිරීමේ බලය මහලේකම් වෙත ඇත.

## 7. ව්‍යවස්ථාවේ සංශෝධන

අ. ව්‍යවස්ථාවේ කිසිම වගන්තියක් සංශෝධනය කිරීමට හෝ අලුතෙන් වගන්තියක් ඇතුලත් කිරීමට හෝ බලතල ඇත්තේ විධායක සභාවට පමණි.

ආ. එක් වසරක් තුල ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සිදුකල හැකි උපරිම සංශෝධන ප්‍රමාණය දෙකකට සීමා වෙයි.

## 8. පක්ෂය විසුරුවාහැරීම

අ. පක්ෂයේ අරමුණු හා පරමාර්ථ ඉටු නොවන බවට හා තවදුරටත් පක්ෂය පැවතීමේ අවශ්‍යතාවයක් නැතිබවට මහා සභාවේ මුළු සාමාජිකත්වයෙන් තුනෙන් දෙකකට වැඩි බහුතරය විසින් කරන යෝජනා සම්මතයක් සහභාගී වීමට සුදුසුකම් දක්වන සියලුම සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකක බහුතර කැමැත්තක් ලද විශේෂ මහා සභා රැස්වීමකින් ද සම්මත වූ පසු විසුරුවාහැරිය හැකිය.

ආ. ඒ වනවිට පක්ෂය සතුව පවත්නා වත්කම් හා බැරකම් සම්බන්දව අවසාන තීරණය ගැනීම විධායක සභාව සතු අතර එහිදී කිසියම් ගැටලුකාරී තත්වයක් ඇතිවුවහොත් ශ්‍රී ලංකාවේ වලංගු නීතියට අනුව අධිකරණය විසින් ලබාදෙන තීන්දුවට යටත් වේ.

## 9. අර්ථදැක්වීම්

මෙහි පාඨයන් අතර කිසියම් පරස්පරතාවයක් ඇත්නම් ඒ සම්බන්ද අර්ථ දැක්වීමේ බලය ප්‍රධාන ලේකම්වරයා සතු අතර එය අවසානාත්මක වේ.

අප පක්ෂයේ ව්‍යවස්ථා වල අර්ථ නිරූපණය සම්බන්දයෙන් ප්‍රශ්නයක් මතුවුව හොත් ව්‍යවස්ථාවේ සිංහල පිටපත ප්‍රමුඛතාවය ගන්නා බව දැන ගත යුතුයි.